අප්‍රේල් 12
බ්‍රහස්පතින්දා
2012

# ගන්දර කැටුව

(1)

~~[illegible] ගන්දර කැටුව~~

ආදූපි මහින්ද වයාතිලකගේ නවකතාවක්

## 1

වැහිබර සවසක, කළුතර ගාලු පාර අද්දර ගඟසිරි හෝටලයට අමුත්තෙකු ගොඩ වැදුණේය. හෝටලය තුළ වූ අඳුරේ හිඳ සිටි කීප දෙනා, මේ අමුත්තා දුන කිසි වගක් නැතිව තම තමන්ගේ මේස මතවූ මාළු පාන්, පැටිස්, කට්ලට්ස්, සීනි බනිස් හෝ කේක් කමින් තේ බොමින් වල්පල් දෙඩූහ.

එක් මේසයක් අසල තනිවම හිඳ සිටි, උපසේන යාන්තම් හිස ඔසවා බලා අමුත්තා දුන වගක් නැතිව තම කාර්යයේ යෙදුණේය. අමුත්තා උස මහත අයෙකු ~~[illegible]~~ බවත්, තද පැහැ දිග කබායක් වැනි ඇඳුමක් ඇඳ සිටි ~~ඒ~~ බවත්, එපමණක්, උපසේනගේ මනසේ යන්තම් සටහන් විය.

එහෙත් මොහොතකින් ඒ සේයාව මනසෙන් මැකී ~~උපසේ~~ මැකී ගොස් උපසේන යළිත් තම කෙටි ලිපියට සිත යොමු කළේය.

"පුතා.

මගේ ෆෝන් එකේ බාප් ඉවරයි. මේ හදිසියෙ කෙටියෙන් ලියන්නෙ. බොස් මාව තව ටිකකින් පිට කරනවා අසයින්මන්ට් එකට කතරගම යන්න.

මතක් වෙලා අම්මාට වෙලාවට බෙහෙත් ටික දෙන්න. මම දවස් තුනකින් ගෙදර එනවා.

තෙරුවන් සරණයි
දෙවි පිහිටයි
තාත්තා"

ලිපිය ලියූ උපසේන යාන්තමට එය කියවා, බලා කළු හම් බෑගයෙන් ගත් කඩා සුදුරු කවරයක බහා එහි ලිපිනය ලියුවේය.

40. වදුරිස්සිංහ පාර,
තිරිහාන
නුගේගොඩ

කවර තඩ දිවගා පාස්‍යාන සිල් තැබූ උපසේන ඒ මුද්දර සහිත කවරය මොහොතකට පිඟාන යටින් තැබුවේ හෝටලයේ ආවතේව කොලුවා. උණු උණු තේ කෝප්පයක් ගෙන ආ බැවිනි.

පොද වැස්සක් වැටෙන්නට විය. තේ කෝප්පයේ උණුසුමෙන් නැගෙන හුමාලය වීදුමක් මෙන් උපසේන ඉදිරියෙන් පාවී නැගී ගියේය. ඒ අතරින් මොහොතකට, ස්‍යාම අමුත්තාගේ, දෑස පෙනුණි. ලොකු ඇඟුම්බර දෑසක් - කළුම කළු - කළු ඉංගිරියාව. හිසෙහි ලා සිටි කැප් තොප්පිය, ස්කොට්ලන්තය වැනි තැනක මිනිසෙකු ලන තොප්පියක් වැනි හැඩයකි. එහි ළා දුඹුරු කොටු ඇඳි තිබුණි. නළල වසා යන වැස්මත්, පැතලි මුදුනත් සහිත තොප්පිය අනතුරුව උපසේනට සිහිපත් කළේ කොහෙ හෝ ධනවත් රටක 'ගොල්ෆ්' ක්‍රීඩාවේ යෙදෙන ධනවතෙකුගේ තොප්පියකි. අමුත්තා බියට යටින් මෙන් උපසේන දිහා බැලුවේය. එය උකුසු බැල්මකි. යම් කිසි ආකර්ෂණීයයක් වෙයි. ආවතේව කොලුවා බයෙන්ම අමුත්තා, අතට ගියවිට, අමුත්තා ගැඹුරු හඬකින් "කෝපි එකක්" කීවේය.

ආවතේව කොලුවා, උපසේන පසුකර ගෙන මුළුතැන්ගේ අතට යන ගමන් "තේ එක හොඳද, සර්?" කියා ඇසුවේ හීන් කටහඬකිනි. උපසේන "ඔව්" කියන විටත් කොලුවා එතැන පසුකර ගෙන ගොසිනි.

උපසේන තේ උගුර බොන ගමන් හොරැහින් මෙන් අමුත්තා දෙස බැලුවේය. අර තොප්පිය... කොහේදෝ හෝ දැක පුරුදු තොප්පියක්... ආතර් කොනන්ඩොයිල් නිර්මාණය කළ ෂර්ලොක් හෝම්ස් නම් රහස් පරීක්ෂකයා, පැළඳින්නේ එවැනි හිස් වැස්මක් නොවේද? ඈ - ඈ මේ හැඩය වෙනස්... තමා සිතන්නේ මොන තරම් අනම් මනම්ද? කාගෙවත් තොප්පියක් තමාට මොන කෙහෙඩියකටද?

උපසේන ඉවසනවට වඩා බියවන්නේ යැයි ඔහුගේ බිරිඳ සුජා කියා තිබිණි. සුජා... සුජාට කොහොම ඇත්ද? ඈගේ දියවැඩියාව... හෘදය රෝගය – කිසිවක් සුව කළ නොහැකි රෝග නොවේ. ඒවා ව්‍යාධිය. ජීවත්වෙන තාක් කල් බෙහෙත් ගත් අවශ්‍යයි. පුතා – නිමල් ඉන්නා එක කොයි තරම් හයියක්ද? නිමල් දෙමාපියන්ට ආදරෙයි. ඇත්තෙන්ම දැන් අට වියට පා තබන නිමල් දරුවෙකුට වඩා වියෙකු මෙනි. විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබ සිටින නිමල් මේ දිනවල ගෙදර හිඳිමත් ලොකු හයියකි.

නිමල්ට ලියූ ලිපිය අවසන්ව මේසය මත විය.

උපසේන තේ කෝප්පය රස විඳිමින් යළි පියවි ලොවට එද්දී දුටුවේ මාළු හාන් එකක් දුවන අමුත්තාවයි. ඔහු අවට ලෝකය ගැන වගක් නැත්තෙක් මෙනි, කෑවේ. ලොකු ලොකු කටවල් – රස විඳින, නලු මරණ ගන්දය උපසේනටද දැනිණි. එත්තරම අමුත්තා උපසේන දෙස එක එල්ලේ බැලුවේය. අතකින් ගත් මාළු හාන් කෑල්ල සිට වනම අල්ලා ගෙන ගල් ගැසී, නලු මිරිද හිඳියේ නතර/කර, මොහොතකට දෙකකට නතරකොට ඔහු උපසේනගේ දෑස් දෙස රවා බලා සිටියේය. ඒ ලැබුණේ ආකර්ෂණයක් විය. උපසේනට ඉවත බැලිය නොහැකි විය.

අමුත්තා යන්තමට හිස සැලුවා පමණි. එය "එන්න" කියන්නා සේ වූ සියුම් සංඥාවකි. උපසේන "මටද?" කියන්නාසේ බලා අවට බැලුවේ අමුත්තා වෙන කෙනෙකුට කතා කරනවාදෝ'යි යන සැකයෙනි. නැත – නැත – උපසේනටම තමා අඬ ගහන්නේ. උපසේන පුදුම කල්ලු කරමින් නැගිට්ටේ හඬක් නගමිනි. පුදුමවේ හඬ – උපසේනගේ සියුම් හඬට තල්ලුවක් විය. වෙන කෙනෙකුට – ඇසුණාද නැද්ද යන වග උපසේනට ගණනක් නොවීය. ඔහු නැගිට අමුත්තා වෙතට ගියේය.

"මෙහෙන් වාඩිගන්න" අමුත්තා ආදරෙන් හඬින් කීවේය. ඉල්ලීමක් සිනහවක් නොවීය. දෑසේ වූයේ "මං දන්නවා" වැනි බැල්මකි.

උපසේන අමුත්තාට මුහුණ ලා හිඳගත්තේය.

"කොහේ යන්ට ගමන්ද?" අමුත්තා ඇසුවේය.

ඇත්තෙන්ම අමුත්තා කීවේ "ගමන්" කියා නොවේ "ගමං" කියායි. ඔහු කතා කළ ආකාරයේද යම් කිසි අමුත්තක් විය. කිරා මැන බලන – සෙමින් සිත බලා කෙරෙන කතාවක්...

"මං- කතරගම යනවා"

"කතරගම?" කී අමුත්තා හිමි හඬක් නගා යළිත් මාළු පාන් කෑල්ලක් හපා විකන්නට විය. ඔහු කෑවේද සෙමින්ය. උපසේන බලා සිටියේය. අමුත්තා යළිත් ඉහළ බල, "ආං කියන්න අමතක උනා- මගේ නම- කාලිංග--"

උපසේන අත දිගු කළේ නොසිතාමය. කාලිංග දකුණතේ වූ මාළු පාන් කෑල්ල කටට ඔබා ගනිමින් අත දිගු කළේය.

ඒ අතේ වූයේ දැඩි සීතලකි. උපසේන කඩිනමින් යළි අත ඇදගත්තේ යම්කිසි විදුලි සැරයක් ඒ අත ඔස්සේ ඇදුනාක් මෙන් ඔහුට ඇඟිල්ලකින් දැනුණි.

"මං- උපසේන." උපසේනට ගොත ගැසිණි. කාලිංගගේ දෑසේ වූ ආකස්මික ආකර්ෂණය විස්තර කළ නොහැක. කබායට යටින් කමිසයක කොටසක් පෙනුණි. එය සුදු කලු ඉරි තිරස්ව දිවූ කමිසයකි. ඒ ඉරි නටන්නාක් මෙනි.

"කතරගම යන්නෙ මොකොටද?" කාලිංගගේ කටහඬ ගැඹුරුය. ළිඳෙන් යන්නක් ඈද වෙලක් වැසී ගෙන එයි.

"ආං-- මං යනවා අපේ පත්තරේ වැඩකට--"

"පත්තරේ? හාං හා හරි-හරි ඔයා ජර්නලිස්ට් කෙනෙක්?"

"ඔ- ඔව්- අපේ බොස් මාව මෙතනින් ගන්නව, කිව්වා."

"හ- හි- හරි." කාලිංග කල්පනාවෙන් මෙන් විමසුමෙන් බලා "මොන පත්තරේද?" කියා ඇසුවේය.

"ජන-දින-"

"ආ එහෙනං ඔය බලන් ඉන්නෙ මිස්ට අනුකෝරල එනකල් වෙන්නැති?"

"ඔ- ඔව්-- අඳුරනවද?"

"එයා ලියන දේවල් මං කියවල තියෙනවා. මොකද මං නොදන්නෙ? මගේ ගෙදරත් ඇවිත් යනවා!"

"ඇත්තට!"

"ඇත්ත නැතුව බොරු කියන්නෙ මොකොටද?"

උපසේනට සිනා නොවී නොහැකි විය. තමා ඇත්තට? යැයි ඇසුවේ පුරුද්දටය. සුපුරා එය "ඇත්තට?" වෙනුවට

අකමැතිය. "ඇත්තට?" කියල අහන්නෙ මං බොරු කියනව කියල හිතන නිසාද? ශ්‍යාමා නිතර අසයි.

"ඇත්තට?" දැන් ඒක පුරුද්දක් වෙලාය.

"ඉතිං කතරගං ගිහිං - ?"

"ආ - මම ලිපි පෙළක් ලියනවා - කතරගම - රුහුණ රජුන්ට තියෙන සම්බන්ධය ගැන..."

"හා - හා පුරාවිද්‍යා වැඩක්?"

"එහෙම කියන්නත් පුළුවන්."

වැනේ මද නිහැඬියාවක් ඒ අතරේ ඇහෙන්නේ ඉස්සෝ බිරි බිරියයි.

උපසේන තමා අත වූ දුරකථනය දෙස බැලුවේය. සමහර විට එහි බැටරියේ ශක්තිය බිඳුවක් වත් ඉතිරිවී ඇත්නම් -- අනුකෝරාල මහත්මයා තවම පමා ඇයි? එන්න බැරි කමක් ඇත්නම් - තමාට සනිවිඩයක් දෙන්නෙ කොහොමද?

"මගෙ මේ ෆෝන් එකේ - බැටරිය --"

"චාජ් ඉවරද?"

"ඒ වගේ."

"කෝල් එකක් ගන්න ඕනද?"

"ආ - ඔව් සුළු දෙයක්නෙ - නොම්මරේ කියන්න."

උපසේන මතකයෙන් බොස්ගේ නොම්මරය කියද්දී කාලිංග නොම්මර එබුවේය. එහෙත් එක්වනම උපසේන අතට දුරකථනය නොදී තමාම කතා කළේය.

"ආං මිස්ට අනුකෝරාල? මම කාලිංග - දියවඩන.. ඔව් - ඔව් --- ආං?"

උපසේනගේ කුතුහලය ඉහවහා යන්නට විය. මේ මිනිහා දැන් පුද්ගලික සංවාදයක් පටන් අරන්.

"මිස්ට අනුකෝරාල ලියන ඒවා මං කියවල හරියට රස විඳිනවා. මම දැන් මේ ඉන්නෙ... කලුතර. උපසේන එක්ක.. හරි - හරි -- මම කියන්නම්. හරි - හරි.. හා හා... මගේ ගෙදර තියෙන්නෙ? කලුපුව ළඟ... හොඳයි - මම එහෙ කෝල් එකක් ගන්නං..." කී කාලිංග දුරකථනය විසන්ධි කළේය.

උපසේන ගොළුවිය. මේ මිනිහා මගේ බොස්ට

කතා කරල ෆෝන් එක තිබ්බා !.

කාලිංගගේ සිනහව නිරායුධ කරන සුලුය. දෑස --- නිව්‍යාජය.

" මොනවද - මිස්ට කාලිංග බොස් කිව්වෙ? "

"හරි - සේරම හරි" කී කාලිංග දුරකථනය තමා ඉදිරියේ මේසය මත දමා ඇඟිල්ලකින් කරකවා, තම දෑත් ඉදිරියට දිග හැර මේසය මත දාල ඉදිරියට අද්දවා ගෙන ගියේ මේ සේරම ඉඩ ටික මගේ කියන්නාක් මෙනි.

දැන් උෂේනට කාලිංගගේ කබයේ යන්තම් පුස් ගඳක් මුසුව කපූරු සුවඳක් දැනුනි.

"ඕ - නවු - සේරම හරි?"

"මාත් එක්ක යමු."

"කොහේද?"

"කලුතුරෙ - මගේ ගෙදර."

"කොහේද?"

"ගන්දර."

"ගන්දර? මාතර [illegible]?"

කාලිංග සිනාසුණේය. "නෑ - නෑ ඒ ගන්දර නොවෙයි. මේ ගන්දර - අපේ ගන්දර. එතැන - කලුතුර අද්දර මගේ ගෙදර - වැඩි ඈත නැහැ."

"මං මොකටද එහේ යන්නෙ?"

"ඇයි ඔව් මං කීවෙ නැතෙ? මිස්ට අනුකෝරල පොඩ්ඩක් පරක්කු වෙනවා කිව්වා. උෂේනට කතා කරන්න විදියක් නැතුව ඉඳල තියෙන්නෙ."

"ඉතිං - ඉතිං"

"ඉතිං ඉතිං - ඉන්නකො කියනකං. මං කතා කළාම කිව්ව, එහෙම නං බයාට මාත් එක්ක අපේ දිහා යන්න. පොඩ්ඩක් රෙස්ට් කරන්න. මිස්ට අනුකෝරල එහාට එන්නම කිව්වා."

"එන්න? දන්නවද? පාර?"

කාලිංග සිනාසුණේය. ප්‍රමාණයටත් වඩා සිනාසුණේය.

"හොඳ උඹයෙක්යැ මිස්ට අනුකෝ-රාල? අපිට ආයෙ කතා කරාවි. එනකොට මං පාර කියාදෙන්න. හරි ලේසියි.

සොයාගන්න. පලකො මං පෙන්නන්න - කලැහුව දැක්ක.."

"මොන කලැහුවද?"

"ගංදුර කලැහුව."

"ගංදුර කලැහුව?"

"ඔව් ගංදුර කලැහුව" කී කාලිංග ගුරුව නැගිට නළලූ කරමින් නැගිට්ටේය. "ගන්න බැහැ එක - අපි යමු"

ඒ කතාවේ යම් කිසි විධානයක් විය. යම් කිසි හැඟීමක්..

"ගංදුර කලැහුව..."

"යමු.."

උපසේන තමා හිඳ සිටි ඩෙස්කය වෙතට ගොස් කඩිනමින් තම බෑගය අතට ගත්තේය.

කාලිංග අනුව ඉදිරි අංගනයට බට ඔහු ආපසු හැරී බැලුවේ නැත.

ඒ බැලුවා නම්, ඔහුට තමා දුටු, ගෙවෙන් ලියූ උයිල අනෝන්තට ඉඩ තිබිණි